# එක්සත් ජනපද මර්දනය!

## GAZA Solidarity US Student Protests


විප්ලවයේ නිදහස උදෙසා කලාව!
කලාවේ පරිපූර්ණ නිදහස උදෙසා විප්ලවය!

කලා - සංස්කෘතික අතිරේකය

2024 මැයි






කැරොලයින් ෆෝලින් අත්අඩංගුවට ගත් අවස්ථාව









"මම මහාචාර්ය කෙනෙක්.."

"කට පියාගෙන යටත් වෙයන්, හු....
තණකොළ ගොල්ලෙ දණ ගහපන් !"

මේ එක්සත් ජනපදයේ විශ්ව විද්‍යාල පරිශ්‍රයක පැවැති උද්ඝෝෂණයක් අවස්ථාවෙ අසන්නට ලැබුණු දෙබසකි. ඇය, කැරොලයින් ෆෝලින් එම විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියකි. අප්‍රේල් 25 වන දින සේවයට පැමිණෙන විට විරෝධතාවයේ සිටි ශිෂ්‍යයකු බිම පෙරළාගෙන යට කරගෙන සිටිනු ඇයට දක්නට ලැබුණි.

'ඇයි ඔහොම කරන්නෙ? ඕක වහාම නවත්වන්න' යැයි පැවසීම නිසා මෙම මහාචාර්යවරිය ම පෙරළා අත්අඩංගුවට ගන්නා ආකාරය වීඩියෝ දර්ශන ලොව පුරා ප්‍රචාරය විය. ඇයට පැය ගණනක් පොලිස් අත්අඩංගුවේ සිටින්නට සිදු විය.

පලස්තීන ජන සහංහාරයට එරෙහිව විරෝධතා පවත්වන එක්සත් ජනපදයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ එම විශ්වවිද්‍යාල භූමියේ සාමකාමී විරෝධතා වාඩිලෑම්වල සිටිති. එහෙත් පොලිසිය කැඳවීම මගින් එම විරෝධය අහෝසි කරලීම විශ්ව විද්‍යාල පාලකයන්ගේ තීරණය විය. එරට විශ්ව විද්‍යාල 15ක පමණ පැවැති විරෝධතා නිසා මේ වනවිට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 600කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති බවද තවත් ශිෂ්‍ය පිරිසක් විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන්ම නෙරපා ඇති බවද වාර්තා වේ. මෙම තත්වය තුළ එක්සත් ජනපදය ලොවට කියන ඊනියා සිවිල් අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය කුමක්දැයි හෙළිව තිබේ.

ලක්ෂ ගගණන් ජනයා මරණයට කැප කර ඇති පලස්තීනයේ සංහාරයට එරෙහිව විරෝධය දක්වන විට එක්සත් ජනපද විශ්ව විද්‍යාල බලධාරින් ඒවා මැඬ පවත්වන් පොලිසිය කැඳවා ඇත. එක්සත් ජනපද පාලකයන් ඊශ්‍රායල් හමුදාවල මානව සංහාරයේ මෘගත්වයට පක්ෂපාති බව පෙන්වා ඇත.





ප්‍රින්ස්ටන් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය හසන් සයිඩ් සහ අචින්ත්‍යා සිවලිංග න් යන ශිෂ්‍යාව අත්අඩංගුවට ගැනීමෙන් පසුව, බලධාරීන් විසින් ඔවුන්ගේ ශිෂ්‍යභාවය සදහටම තහනම් කර ඇත.